# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/42 - 2014 මැයි මස 28 වැනි බදාදා - 2014.05.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත**

10අ(1)(අ) වගන්තිය යටතේ දැන්වීම

**මතුගම ප්‍රාදේශීය සභාව**

මතුගම ප්‍රාදේශීය සභාවේ සභිකයකු වන ඔවිටිගල හේවාගේ රෝහණ චිත්‍රාල් ප්‍රියන්ත මහතා ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ සාමාජිකයකුව සිටීම අවසන් කර ඇති නිසා, එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අත හැර ඇති බව මතුගම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී හැන්නැදිගේ රසික ප්‍රියංග පීරිස් වන මම, (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 10අ(1)(අ) වැනි වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශ කරමි.

රසික පීරිස්,
තේරීම්භාර නිලධාරී,
මතුගම ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 27 වන දින,
මැතිවරණ කාර්යාලය,
කළුතර.

06 - 306

1A - G 019627 — 85 (2014/05)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල
පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත
(262 වන අධිකාරය වූ)
පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වගන්තිය යටතේ
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ
සභික ධුරයේ පුරප්පාඩුව පිරවීම**

ඉල්ලා අස්වීම හේතුකොට ගෙන යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ සභික ධුරය පුරප්පාඩු වී ඇති හෙයින් ද ;

කනංකෙ ලියනගේ සුමනසිරි නම් වූ සභිකයා අයත් වන එක්සත් ජාතික පක්ෂය නම් වූ පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් ට දින තිහක (30) ක කාල පරිච්ඡේදයක් ඇතුළත සභිකයකු වශයෙන් තෝරා පත් කර ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු වූ, ඒ පක්ෂයට අයත් ඒ යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තේරී පත් වීම සඳහා ආඥාපනත යටතේ සුදුසුකම් ලත් තැනැත්තකු නාමයෝජනා කිරීමට, ඉහත කී ආඥාපනතේ 65අ(2) වන වගන්තිය යටතේ මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද ;

ඒ පුරප්පාඩුව පිරවීම සඳහා ඉහත කී ආඥාපනත යටතේ සුදුසුකම් ලැබූ තැනැත්තකු වන ගාමිණී නානායක්කාර මහතා ඉහත කී පිළිගත් දේශපාලන පක්ෂයේ ලේකම් විසින් නම් කරනු ලැබ ඇති හෙයින් ද ;

යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී අන්තෝනි බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා වන මම, 2013 අංක 30 දරන පළාත් පාලන ආයතනවල පුරප්පාඩු පිරවීමේ (විශේෂ විධිවිධාන) පනතින් සංශෝධිත (262 වන අධිකාරය වූ) පළාත් පාලන ඡන්ද විමසීම් ආඥාපනතේ 65අ(2) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින් ගාමිණී නානායක්කාර මහතා යක්කලමුල්ල ප්‍රාදේශීය සභාවේ සභිකයකු වශයෙන් තෝරා පත්කර ගත් බව මෙයින් දැන් ප්‍රකාශ කරමි.

ඒ. බී. අයි. ද සිල්වා,
තේරීම්භාර නිලධාරී,
යක්කලමුල්ල ප්‍රාදේශීය සභාව.

2014 මැයි මස 27 වන දින,
මැතිවරණ කාර්යාලය,
ගාල්ල.

06 - 307

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.